**ශීර්ෂය 429 ග්‍රාමීය කුඹුරු හා ආශ්‍රිත වැව්, ජලාශ හා වාරිමාර්ග සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය**
**-------------------------------------------------------------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන
**-----------------**

### 1.1 තත්ත්වාගණනය කළ මත
**------------------------------**

ග්‍රාමීය කුඹුරු හා ආශ්‍රිත වැව්, ජලාශ හා වාරිමාර්ග සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය**,** එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ග්‍රාමීය කුඹුරු හා ආශ්‍රිත වැව්, ජලාශ හා වාරිමාර්ග සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ  මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 මැයි 25  දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 ඔක්තෝබර් 06  දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.5  ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට  ග්‍රාමීය කුඹුරු හා ආශ්‍රිත වැව්, ජලාශ හා වාරිමාර්ග සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
**----------------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම
**---------------------------------------------------------------------------------------------------**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරිම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූලධන වියදම්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් ස්ථාවර වත්කම් ගිණුමගත කිරීම සම්බන්ධව ලබාදී ඇති උපදෙස් අනුව සංකේත අංක 61414 යටතේ වැව් ජලාශ ඇලවේලි ආදී මූල්‍ය නොවන වත්කම් හදුනාගෙන ගිණුම්ගත කළ යුතු වුවත් 2021 වර්ෂය තුළ රු.2,568,196,192 ක් වැයකර සංවර්ධනය කරන ලද දේපල නිෂ්චිත ලෙස හදුනාගෙන මූල්‍ය නොවන වත්කම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. ඉන් රු.375,949,842 පමණක් අමාත්‍යාංශය විසින් සෘජුව වැයකර තිබූ අතර ඉතිරිය වෙනත් දෙපාර්තමේන්තු වෙත නිදහස් කළ ප්‍රතිපදන යටතේ වැයකර ගිණුම්ගත කර තිබුණි. එකි ප්‍රතිපදන නිදහස් කිරීමේදී ගොඩනගන වත්කම් එකි ආයතනයන්හි මූල්‍ය නොවන වත්කම් ලෙස හදුනාගත යුතු බවට උපදෙස් ලබාදී නොතිබුණි. ඒ අනුව එම සම්පූර්ණ වත්කම් අමාත්‍යාංශ ගිණුම් මගින් අනාවරණය කල යුතුව පැවතුණි. | 2021 වර්ෂයේදී වාරිසෞභාග්‍යා වැඩසටහන යටතේ ග්‍රාමීය වැව් අමුණු සංවර්ධන කිරීම, යටිතල පහසුකම් සංවර්ධනය වැය ශීර්ෂ 429-2-3-2-2506 යටතේ රු. මිලියන 3000 ක ප්‍රතිපාදන වෙන්කර තිබූ අතර සත්‍ය වියදම රුපියල් 2,568,196,192කි. රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් ස්ථාවර වත්කම් ගිණුම්ගත කිරීම සම්බන්ධව CIGAS වැඩසටහන යටතේ හදුන්වා දී ඇති වත්කම් කලමණාකරණ මෘදුකාංගයට අනුව මූලධන වත්කම් අත්පත් කරගැනීමේ 2101-2106 දක්වා වැයශීර්ෂවල වියදම් පමණක් වත්කම් වශයෙන් ගිණුම්ගත වන අතර අනෙක් ප්‍රාග්ධන වැය ශීර්ෂ යටතේ අත්පත් කරගත් වත්කම් පවතිනම් ආරම්භක ශේෂ ලෙස ප්‍රාග්ධනිත කරන ලෙස උපදෙස් දී ඇත.<br>උක්ත යටිතල පහසුකම් සංවර්ධනය 2506 වැය ශීර්ෂය යටතේ දරන ලද වැව් ජලාශ ඇලවේලි ආදිය සංවර්ධනය කිරීමක් හෙයින් මෙම අමාත්‍යාංශයේ මූල්‍ය නොවන වත්කම් ලෙස ගිණුම්ගත කිරීම ප්‍රායෝගික නොවේ. | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් මූල්‍ය නොවන වත්කම් ගිණුම්ගත කිරීම සම්බන්ධව 2017 ජුනි 28 දිනැති චක්‍රලේඛයේ විධිවිධානයන්ට අනුකූලව මූල්‍ය නොවන වත්කම් ගිණුමගත කළ යුතුය. මූලධන වැය විෂය යටතේ ගණන්දීමේ නිලධාරීන් අතර සිදුවන ගණුදෙනු සඳහා ප්‍රතිපදන නිදහස් කිරීමේදී එම ප්‍රතිපාදන උපයෝජනයෙන් අත්පත් කර ගනු ලබන හෝ වැඩිදියුනු කරනු ලබන මූල්‍ය නොවන වත්කම් ගිණුම්ගත කිරීම සඳහා නිෂ්චිත උපදෙස් නිකුත්කල යුතු අතර ඒ අනුව කටයුතු කර ඇති බව තහවුරු කර ගැනීම සඳහා අභ්‍යන්තර පාලන පද්ධතිය නැවත සමාලෝචනයට ලක්කර අවශ්‍ය පාලනයන් හදුන්වාදිය යුතුය. |

| | | |
|---|---|---|
| | තවද, සංවර්ධනය කරනු ලැබූ ග්‍රාමීය වැව් අමුණු සියල්ල වාරිමාර්ග දෙපාර්තමේන්තුව, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, පලාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව සතු බැවින් මෙම අමාත්‍යාංශයේ වත්කම් ලෙස ගිණුම්ගත කිරීමට දැනට තිබෙන වත්කම් ගිණුම්ගත කිරීමේ ක්‍රමවේදවල ප්‍රතිපාදන නොමැත. | |

**1.6.2. දේපල පිරියත හා උපකරණ**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානය වනවිට රාජ්‍ය අමාත්‍යාංශයට අයිති පිරිවැය රු.62,490,000 වාහන 4 ක් ලියාපදිංචි කර තිබුණි. ඉන් රු.27,990,000 ක් වූ වාහන පිළිබඳ තොරතුරු මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ ඇතුලත් කර නොතිබුණි. | විගණන විමසුමෙහි සඳහන් *PK 7066* හා *PK 7067* අංක දරණ ටොයෝටා හයිලක්ස් ඩබල් කැබ් රථ දෙක 2021.12.22 දින අයවැය දෙපාර්තමේන්තුව මගින් මූල්‍ය කල්බදු ක්‍රමය යටතේ ලබාදී ඇත. මෙහි මූල්‍ය ප්‍රතිපාදන ආයතනය ලෙස ලංකා බැංකුව රත්මලාන ශාඛාව කටයුතු කරන අතර ඉදිරි වසර 05 ක් සඳහා මූල්‍ය වාරික ගෙවා නිමකරන තුරු ලංකා බැංකුව වාහනවල පරම අයිතිකරු වන අතර මෙම වාහන සඳහා රක්ෂණ බලපත්‍ර ලබා ගෙන ඇත්තේ ලංකා බැංකුවේ අයිතිය යටතේය. වාරික ගෙවා නිම කිරීමෙන් අනතුරුව මෙම රථ දෙකෙහි අයිතිය අමාත්‍යාංශය සතු වන බැවින් ඉන් අනතුරුව දේපළ පිරියත හා උපකරණ යටතේ ගිණුම් ගත කිරීමට කටයුතු කරනු ලැබේ. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදි පොදු සම්මත ගිණුම්කරන මූලධර්මයන්ට අනුකූලව ප්‍රමණවත් තොරතුරු හෙළිදරව් කර ඇති බවට තහවුරු කරගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 අග්‍රිම කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්විම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළ රාජ්‍ය අමාත්‍යාංශය විසින් ඉටුකිරීමට සැලැසුම් කරන ලද කාර්යයන් සඳහා රු.743,413,000 ක අග්‍රිම මුදලක් ඉල්ලුම් කර තිබුණ ද, මහා භාණ්ඩාගාරය රු.463,011,000 ක් නිදහස් කර තිබුණි. ඒ අනුව ඉල්ලුම් කරන ලද අග්‍රිමයෙන් සියයට 37.7 ක් ලැබී නොතිබුණි. | එකග වෙමි. | අයවැය ලේඛන පාලනය විචලතා අඩුවන පරිදි පුරෝකතනය සිදුකල යුතුය. |

### 2.2 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්විම | නිර්දේශය |
|---|---|---|
| ඇස්තමේන්තු සකස්කිරීමේ දී අවශ්‍යතා හඳුනාගැනීමකින් තොරව වෙන්කිරීම් සිදු කිරීම සහ සැලැසුම් කරන ලද පරිදි වැඩ කටයුතු සිදු නොකිරීම හේතුවෙන් වැය විෂයයන් 15 ක් සඳහා වෙන්කර තිබුණු එකතුව රු. 81,283,000 ක් වූ ශුද්ධ වෙන්කිරීම් වලින් එකතුව රු. 23,547,689 ක් හෙවත් සියයට 39 ක් ඉතිරි වී තිබුණි. එක් එක් වැය විෂය යටතේ වූ ඉතිරිය සියයට 20 ක සිට සියයට 92 ක් අතර පරාසයක් ගෙන තිබුණි. | 2021 රාජ්‍ය වියදම් සමාලෝචනය සම්බන්ධ අමාත්‍ය මණ්ඩල සංදේශය 21/1596/304/134 හි උපදෙස් පරිදි ඇතැම් වැය විෂයන්හි ප්‍රතිපාදන ඉතිරි කිරීමට සැලසුම් කල අතර කාර්යමණ්ඩල පුරප්පාඩු හේතුවෙන් පුද්ගලික පඩිනඩි වැය විෂයන් වලද කොරෝනා වසංගතය තත්වය හේතුවෙන් නිලධාරීන් අතිකාල, ක්ෂේත්‍ර රාජකාරි හා පුහුණුවීම් වල නියැලීම සීමා වීම හේතුකොටගෙන අතිකාල,ගමන් වියදම් හා පුහුණු වැය විෂයන් වල ප්‍රතිපාදන අපේක්ෂිත පරිදි සිදු නොවුනි. තවද 2021 ප්‍රසම්පාදන සැලැස්ම යටතේ මිලදී ගැනීමට සැලසුම් කරන ලද මුලධන වත්කම් මිලදී ගැනීම් කටයුතුද රාජ්‍ය වියදම් සමාලෝචන චක්‍රලේඛය අනුව සීමා කිරීමට කටයුතු කලෙමි.එහෙයින් එම වැය විෂයන් වලද ප්‍රතිපාදන ඉතිරි වීම් වාර්තා වුණි. | අයවැය සකස් කිරීමේදී හැකිතාක් දුරට විචලතා අවම වන පරිදි සිදුකල යුතුය. |

## 2.3 බැරකම් හා බැදීම්වලට එළඹීම

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ------------------------ | ------------------------------ | ------------- |
| (අ) මුදල් රෙගුලාසි 94(1) ප්‍රකාරව වාර්ෂික ඇස්තමේන්තුවල ප්‍රතිපාදන ඇත්නම් පමණක් දෙපාර්තමේන්තුවක් විසින් වැඩක් හෝ සේවාවක් හෝ සැපයුමක් සඳහා කිසියම් වියදමකට හෝ බැදීමකට හෝ එළඹිය හැකි වුවද සමාලෝචිත වර්ෂය වෙනුවෙන් වෙනත් මූලධන වියදම් අනුමත ප්‍රතිපාදන ඉක්මවා රු. 62,127,413 ක බැරකම් ඇතිකරගෙන තිබුණි. | මුදල් රෙගුලාසි 94(1) ප්‍රකාරව වාර්ෂික ඇස්තමේන්තුවල ප්‍රතිපාදන ඉක්මවා බැදීම් සිදු නොකල යුතු බව සඳහන් කර තිබුනද මු.රෙ 94(3) ප්‍රකාරව පූර්ව පිරිවැය ඇස්තමේන්තු යෝජනා ක්‍රමයක් මගින් ව්‍යාපෘතියක වියදම වාර්ෂික ඇස්තමේන්තුවක පූර්ව පිරිවැය ඇස්තමේන්තුවක් දැක්වෙන විටක ඒ වැඩ සඳහා පිළියෙල කරන ලද වැඩසටහන අනුව විලම්භිත බැරකමකට නොබැදී එහි යෝජනා නොහොත් ව්‍යාපෘතිය භාර ගැනීමට හෝ ක්‍රියාත්මක කිරීමට නොහැකි බැව් දෙපාර්තමේන්තු ප්‍රධානියාට ඒත්තු යන කල්හි මු.රෙ 94(1) විධිවිධාන නොතකා එකී බැරකමට බැදීමට අධිකාරී බලය දීමට ඒ දෙපාර්තමේන්තු ප්‍රධානියාට පුළුවනි. එහෙත් එකී බැරකම් වලට අමතරව අනුමත කරන ලද මුළු පිරිවැය ඇස්තමේන්තු ඉක්මවා වියදම් දැරීම සිදු නොවිය යුතු වේ.<br><br>ඒ අනුව වාරි සෞභාග්‍යා වැඩ සටහන යටතේ 2021 – 2023 මාධ්‍ය කාලීන අයවැය රාමුව තුල ග්‍රාමීය කුඹුරු හා ආශ්‍රිත වැව් ජලාශ 5000ක් සංවර්ධනය කිරීම සඳහා 429-2-3-2-2506 වැය ශීර්ෂය යටතේ රු. මිලියන 11000ක ප්‍රතිපාදන ලබාදීමට ඇස්තමේන්තු කර තිබිණි. ඒයින් 2021 වර්ෂය සඳහා මිලියන 3000 ප්‍රතිපාදන වෙන්කර තිබුණු අතර 2021 සැප්තැම්බර් මස වන විට වැව් අමුණු 1400 ක වැඩ ආරම්භ කර තිබුණි. | වර්ෂය අවසානයේ ගෙවිය යුතු සියළුම ශේෂ නිවැරදිව හඳුනාගෙන බැරකම් ලෙස ගිණුම් ගත කරන බව සහතික වීම පිණිස ඊට අදාල අභ්‍යන්තර පාලන කටයුතු යලි සමාලෝචනයට ලක්කර වාර්තා කරන පද්ධතින් තුල අවශ්‍ය වෙනස්කම් සිදුකල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | රාජ්‍ය මුදල් චක්‍රලේඛ 255/2017 ප්‍රකාරව 2021 දෙසැම්බර් 31 දිනට බැදීම් හා බැරකම් ප්‍රමාණය රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් නඩත්තු කරන ලද තොරතුරු පද්ධතිය දිනපතා යාවත්කාලීන කිරීම සඳහා සෑම වියදම් ඒකකයක්ම සම්බන්ධයෙන් ඇති කරගන්නා බැදීම් බැරකම් හා එම බැරකම් නිදහස් කිරීම පිළිබඳව තොරතුරු වෙබ් අඩවියට උඩුගත **(UP LORD)** කළ යුතු බවට උපදෙස් ලබාදී තිබුණි. 2021 වර්ෂයට අදාලව සිගාස් වැඩසටහනට ඇතුලත්කර තිබූ දත්ත අනුව බැදීම් රු.1,186,165,809 හා බැරකම් රු. 893,572,086 වූ අතර මූල්‍ය ප්‍රකාශන වල සටහන **(iii)** අනුව බැදීම් රු.645,807,163 හා බැරකම් රු. 519,517,145 විය. ඒ අනුව බැදීම් රු.540,358,646 හා බැරකම් රු. 374,054,941 ක වෙනස්කම් නිරික්ෂණය විය. | NEW CIGAS උඩුගත කරන ලද බැරකම් වල යම් යම් දෝෂ පවතින බව එම ආයතන වලින් විමසීමේදී අනාවරණය වුණි. වාරීසෞභාග්‍යා වැඩසටන යටතේ වෙනත් දෙපාර්තුමේන්තු වලට ලබා දුන් ප්‍රතිපාදන යටතේ 2021.12.31 වන දිනට බැරකම් හා බැදීම් NEW CIGAS වැඩසටහන යටතේ උඩුගත කරන ලද තොරතුරු මත අවසන් ගිණුම් වලට ඇතුලත් කිරිමට උපදෙස් ලබා දී තිබූ හෙයින් වෙන වෙනම පෙර වර්ෂ වල මෙන් උපලේඛන මගින් බැරකම් ලබා ගැනීමට ප්‍රමාද වුණි. ඒ හේතුකොටගෙන උප කාර්යාල රාශියක් හරහා ගිණුම් කටයුතු සිදු කරන වාරිමාර්ග දෙපාර්තුමේන්තුව , ගොවිජන සංවර්ධන දෙපාර්තුමේන්තුව ඒ ඒ ආයතන විසින් උඩුගත කරන ලද බැරකම් හා බැදීම් ලිඛිතව තහවුරු කිරීමට අපොහොසත් වුණි. | රාජ්‍ය මුදල් චක්‍රලේඛ 255/2017 අනුකූලව බැදීම් හා බැරකම් පවත්වාගෙන යා යුතුය. |

## 2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **නීති,රීති හා රෙගුලාසි වලට යොමුව** | **අනුකූල නොවීම** | | |
| **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ** මුදල් රෙගුලාසි 146 | වෙනත් ගණන්දීමේ නිලධාරින් වෙත ස්වකිය වැය ශිර්ෂය යටතේ වියදම් දැරීම සඳහා නිදහස් කරනු ලබන ප්‍රතිපාදන යටතේ ඉටුකරනු ලබන වැඩෙහි සැලැස්ම, | 2021 වැඩ සැලැස්ම සකස් කිරීමේදී ඒ ඒ දෙපාර්තුමේන්තු මගින් ව්‍යාපෘති යෝජනා ලබා ගත් අතර ඒවා අමාත්‍යාංශය මගින් සමාලෝචනය කර වැඩ සැලැස්මට ඇතුලත් කරන | මුදල් රෙගුලාසි 146 සඳහන් කරුණු ආවරණය වන පරිදි ප්‍රගතිය වාර්තා කිරීම සඳහා වන ආකෘතින් හඳුන්වාදී ඒ අනුව පසුවිපරම් කටයුතු සිදුකල යුතුය. |

ප්‍රගතිය, වියදම් සහ ඉතිරිය පිළිබද විමසිලිමත් විය යුතු අතර වැඩ සැලැස්මෙන් බැහැර නොවන බව හා සීමාවන් නොයික්ම වන බව තහවුරු කර ගැනීමට කටයුතු කළයුතු වුවත් වියදම් විෂය අංක 2506 යටතේ වෙනත් ගණන්දීමේ නිලධාරින් වෙත නිදහස්කල ප්‍රතිපාදන සම්බන්ධයෙන් උක්ත විධිවිධාන අනුව කටයුතු කර නොතිබුණි.

ලදී. ඒ අනුව 2021 වර්ෂය සඳහා සකස් කරන ලද වැඩ සැලැස්මට අනුව මාසික ප්‍රගති වාර්තා ඒ ඒ දෙපාර්තමේන්තු මගින් ලබා ගත් අතර එහි ප්‍රගතිය පිළිබද සාරාංශ වාර්තා සකස් කරන ලදී. එමෙන්ම එම වැඩ සැලැස්මෙහි අන්තර්ගත වැඩ පිළිබද දෙසතියකට වරක් භෞතික ප්‍රගතිය පිළිබද ප්‍රගති වාර්තාද අමාත්‍යාංශය මගින් ලබා ගන්නා ලද අතර, එම වාර්තා පදනම් කර ගනිමින් සෑම මාසයකට වරක් පාහේ ප්‍රගති සමාලෝචන රැස්වීම් පවත්වන ලදී, මෙම රැස්වීම් වලදී ඒ ඒ දෙපාර්තමේන්තු වෙත ප්‍රතිපාදන ඉතිරිය පිළිබදව මෙන්ම ලබා දී ඇති ප්‍රතිපාදන අනුව වියදම් සීමා පවත්වා ගන්නා ලෙස උපදෙස් දෙනු ලැබ ඇත .එමෙන්ම වෙනත් දෙපාර්තුමේන්තු වෙත වැඩ සැලැස්ම සඳහා ප්‍රතිපාදන නිදහස් කිරීමේදී එම ප්‍රතිපාදන නිදහස් කිරීමේදී එම ප්‍රතිපාදන සිමාව තුල වියදම් දැරීම සඳහා ද, සෑම විටම ලිඛිත උපදෙස් ලබා දී ඇත. ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවති අතර මෙම රැස්වීම් වලට අදාල සාකච්චා සටහන් (minutes) මගින් ව්‍යාපෘති කළමනාකරණ පිළිබද ගන්නා ලද සියළු තීරණ හා උපදෙස් සියළුපාර්ශවයන් වෙත නොපමාව ලබාදුන් අතර එම සටහන් මෙම අංශයේ ගොනු කර ඇත.

## 3. මෙහෙයුම් සමාලෝචනය

---------------------------

### 3.1 කළමනාකරණ දූර්වලතා

---------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්විම | නිර්දේශය |
|---|---|---|
| (අ) වාරිසෞභාග්‍යා වැඩසටහන යටතේ 2021-2023 මධ්‍යකාළින අයවැය රාමුව තුල වැව්/අමුණු හා ආශ්‍රිත ඇලමාර්ග 5000 ක් සකස් කිරිමට පැවරි තිබුණි. ඒ යටතේ 2021 වර්ෂය තුල රු.2,568,196,192 වැයකර දිස්ත්‍රික්ක 25 ම ආවරණය වන පරිදි වැව්/අමුණු 1400 ක් පමණක් ප්‍රතිසංස්කරණය කර තිබුණි. | වැඩසටහනට අනුගත වෙමින් වාරිමාර්ග අමාත්‍යාංශය, වාරිමාර්ග රාජ්‍ය අමාත්‍යාංශය හා මහවැලි රාජ්‍ය අමාත්‍යාංශය යටතේ වැව්/අමුණු/ඇලවේලි 5000ක් ප්‍රතිසංස්කරණය කිරීමේ කාර්යයට සෘජුව දායකත්වය ලබා දිය යුතු බවට යෝජනා විය.<br>මධ්‍යකාලීන අයවැය රාමුව තුළ 2021 වර්ෂය සඳහා වාරිමාර්ග රාජ්‍ය අමාත්‍යාංශය වෙත රු.මිලියන 3000 ක ප්‍රතිපාදනයන් ලබා දෙන ලදී. තවද, මීට සමාන්තරව වාරිමාර්ග අමාත්‍යාංශයට හා මහවැලි රාජ්‍ය අමාත්‍යාංශවලට ද, වාරි සෞභාග්‍යා වැඩසටහන යටතේ උක්ත ප්‍රතිසංස්කරණ සඳහා වෙන වෙනම ප්‍රතිපාදන ලබා දෙන ලදී. ඒ අනුව වාරිමාර්ග රාජ්‍ය අමාත්‍යාංශය මගින් 2021 වසර සඳහා වැව්/අමුණු/ඇලවේලි 1000ක ප්‍රතිසංස්කරණ ඉලක්කයක් ලබා ගත් අතර එම ඉලක්කය ඉක්මවා වැව්/අමුණු/ඇලවේලි 1300ක පමණ ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කරන ලදී. | වැඩසටහන ක්‍රියාත්මක කරන සියළු ආයතන වල එම වැඩසටහනේ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය සම්බන්ධ තොරතුරු ඇතුලත් යාවත්කාලීන වාර්තාවක් පවත්වාගත යුතුය.<br>එම ව්‍යාපෘතින්වලට අදාලව පහත සඳහන් කරුණු පිළිබද නිර්ණායක සකස් කල යුතුය.<br>I. වැව් /අමුණු ප්‍රතිසංස්කරණය සඳහා හඳුනාගැනීමේ ක්‍රමවේදය හා ප්‍රමුඛතා ලබාදීමේ ක්‍රමවේදය.<br>II. ප්‍රතිපාදන සිමාවන් තුල ඉටුකල හැකි කාර්යයන් නිර්ණය කිරීමේ ක්‍රමවේදය.<br>III. වැව්/අමුණු පුලුල් කිරීමේ හා ගැඹුරු කිරීමේදි ඉවත් කරනු ලබන රොන්මඩ හා පස් සම්බන්ධයෙන් වු පාලනයන් හා බැහැර කිරීම් පිළිබද නිර්ණායක.<br>IV. කෘෂිකාර්මික කටයුතුවලට බාධා නොවන පරිදි වැව් ප්‍රතිසංස්කරණ කලයුතු කාලවකවානු තිරණය කිරීමට අදාල නිර්ණායක.<br>V. පාරිසරික නිතිරිතින්ට අනුකූල වීම සම්බන්ධ නිරිණායක. |

(ආ) වාරි සෞභාග්‍යා වැඩසටහන යටතේ කුඩා හා මධ්‍ය ප්‍රමාණයේ වැව්වල තැන්පත් වී ඇති රොන්මඩ ඉවත් කිරීමේ නියමු ව්‍යාපෘතිය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| i. | වැව් වල පතුල ශුද්ධ කිරීමේදි ඉවත්කරනු ලබන ද්‍රව්‍ය සඳහා මිනුම්ගත කර ගාස්තු අයකිරීම කළයුතු වුවත් රජය විසින් නියම කරණු ලබන ගාස්තු නිෂ්චය කිරීමට කටයුතු කර නොතිබුණි. | පාංශු විමර්ශනය මගින් ද්‍රව්‍යවල නිශ්චිත සංයුතිය මැනීම වියදම් අධික වන අතර රාජ්‍ය වියදම් අඩු කිරීමට නොහැකි වනු ඇත. එබැවින්, ග්‍රාමීය වැව් වල ඉවත් කරන ලද රොන් මඩ සඳහා වර්ගීකරණය කර මිලක් නියම කිරීම ප්‍රායෝගික නොවේ. කියුබ් 03ක් සඳහා රුපියල් 1000 සිට 1750 දක්වා ගෙවීමට සියලු පාර්ශවයන් එකඟ වූ අතර නියමු ව්‍යාපෘතියෙන් ලබා ගන්නා අත්දැකීම් අනුව තත්ත්වය සමාලෝචනය කර කියුබ් එකක ගාස්තුව තීරණය කිරීමට එකඟ විය. | වැව්වල පතුල සුද්ධ කිරීමේදි ඉවත්කරනු ලබන ද්‍රව්‍ය මිනුම්ගත කර 2009 මැයි 06 දිනැති අංක 1600/18 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් නියම කර ඇති ගාස්තු හෝ ඊට අඩු නොවන ගාස්තුවක් නිෂ්චය කොට අයකිරීමට කටයුතු කළ යුතුය. |
| ii. | වැව් වල රොන්මඩ හා පස් ඉවත් කිරීම සඳහා සංවර්ධන පාර්ශව කරුවන් සමග එකඟව තිබූ ගිවිසුම අනුව, එම කටයුතු උප කොන්ත්‍රාත් ලබාදිය හැකි බවට කොන්දේසි ඇතුලත්ව නොතිබිය දී උප කොන්ත්‍රාත් ලබා දී තිබුණි. | රාජ්‍ය අමාත්‍යාංශය විසින් සකස් කරන ලද මාර්ගෝපදේශ මාලාවට අනුව රොන්මඩ ඉවත් කිරීමේ කටයුතු සංවර්ධන ව්‍යවසායයන් විසින් ස්වාධීනව ක්‍රියාත්මක කරතැයි රාජ්‍ය අමාත්‍යාංශය අපේක්ෂා කරයි. අනාගත රොන්මඩ ඉවත් කිරීමේ කටයුතු වලදී, නියමු ව්‍යාපෘතියෙන් උගත් පාඩම් හරහා සංවර්ධන පාර්ශ්ව සහ උප කොන්ත්‍රාත්කරුවන් අතර ඇති කොන්ත්‍රාත්තුවේ වැඩි දියුණුවක් සිදු කිරීම රාජ්‍ය අමාත්‍යාංශය අපේක්ෂා කරයි. ත්‍රෛපාර්ශවීය ගිවිසුමේ උප කොන්ත්‍රාත්කරුවන් ගැන සඳහන් නොවුණද උප කොන්ත්‍රාත්කරුවන් නොවැළැක්විය හැකි අතර උප කොන්ත්‍රාත්තු කිරීම සාමාන්‍ය කොන්ත්‍රාත්තු පටිපාටියකි. තෝරාගත් සංවර්ධන පාර්ශවය විසින් උප කොන්ත්‍රාත්තු කිරීම සම්බන්ධයෙන් රාජ්‍ය අමාත්‍යාංශයට විරුද්ධත්වයක් නොතිබූ අතර වැඩ සඳහා | බාහිර පාර්ශවයන් සමග ඒළබෙවන ගිවිසුම් සඳහා නීතිපති දෙපාර්තමේන්තුවේ නිශ්කාෂණ ලබාගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | සංවර්ධන පාර්ශවය සමඟ පමණක් රාජ්‍ය අමාත්‍යාංශය කටයුතු කරන ලදී. | |
| iii | සංවර්ධන පාර්ශව කරුවන් විසින් පුද්ගලික කොන්ත්‍රාත් කරුවන් යොදවා රොන්මඩ ඉවත්කරනු ලැබූ වැව් 37 න් රොන්මඩ කියුබ් 56,735 ක් ඉවත්කල බව වාර්තාකර තිබුණි. ඉවත්කරනු ලබන රොන්මඩ සඳහා වූ රු. 560 ක අවම ගාස්තුව නිශ්චය කිරීමට රාජ්‍ය අමාත්‍යාංශය විසින් කටයුතු නොකිරීම නිසා ඒ සඳහා අයකල යුතු මුදල රු.24,057,493 ක් රාජ්‍ය ආදායමට ගෙන නොතිබුණි. | ලංසුකරුවන් විසින් කියුබ් එකකට රුපියල් 333.30 සිට රුපියල් 650.00 දක්වා විවිධ මිල ගණන් ඉදිරිපත් කරන ලදී. එබැවින් රජයට අපේක්ෂිත මුළු ආදායම රු.20,620,028.20 කි. ත්‍රෛපාර්ශවීය ගිවිසුමට අනුව, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත නියමිත මුදල ගෙවීම අදාළ සංවර්ධන පාර්ශවයේ වගකීම වන අතර රජයට ලැබිය යුතු ප්‍රේෂණ අයකර ගැනීම සම්බන්ධයෙන් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව වගකිව යුතුය. | වර්ෂය තුල ඉවත් කරණු ලබන රොන්මඩ සඳහා සම්පූර්ණ ලැබිය යුතු මුදල් ගිණුම්ගත කළ යුතු අතර එමගින් ලැබෙන ආදායම් රාජ්‍ය ආදායමට බැරකල යුතුය. |
| Iv | සංවර්ධන පාර්ශව කරුවන් විසින් පුද්ගලික අංශයේ කොන්ත්‍රාත් කරුවන් සමග ගිවිසුම්වලට එලඹ තිබූ අතර එකී ගිවිසුම් සඳහා රාජ්‍ය අමාත්‍යාංශයෙන් හෝ වැව්භාර ආයතනයෙන් එකගතාවය ලබාගෙන නොතිබුණි. එහි සඳහන් ඇතැම් කොන්දේසි මගින් අවිධිමත් කැණීම් වලට ඉඩ සපයා ඇති අතර වැවෙහි පැවැත්ම හා ආරක්ෂාවටද තර්ජනයක්ව පැවතුණි. | රාජ්‍ය අමාත්‍යාංශය විසින් සකස් කරන ලද මාර්ගෝපදේශ මාලාවට අනුව රොන්මඩ ඉවත් කිරීමේ කටයුතු සංවර්ධන ව්‍යවසායයන් විසින් ස්වාධීනව ක්‍රියාත්මක කරතැයි රාජ්‍ය අමාත්‍යාංශය අපේක්ෂා කරයි. කෙසේ වෙතත්, සංවර්ධන ව්‍යවසායයන් විසින් උප කොන්ත්‍රාත්තු කිරීම පිළිබඳව රාජ්‍ය අමාත්‍යාංශයේ කිසිදු විරෝධයක් නොමැත. | වැව්වල පැවැත්ම හා ආරක්ෂාවට තර්ජනයක් වන පරිදි කැනීම් සිදුකර ඇති උපකොන්ත්‍රාත් කරුවන් සම්බන්ධයෙන් නෛතික ක්‍රියාමාර්ග ගත යුතුය. |
| v. | පෞද්ගලික කොන්ත්‍රාත් කරුවන් විසින් ඉවත්කරන ලද ඛණිජ ද්‍රව්‍ය වෙනුවෙන් ඉහත සඳහන් පරිදි අවිධිමත් ලෙස එලඹ ඇති ගිවිසුම් අනුව රු.13,573,634 ක් ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය(NEMO), රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව(SD&CC) සහ ඉංජිනේරු කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශන | උප කොන්ත්‍රාත්කරුවන්ගෙන් ඉතිරි ගෙවීම් සියල්ල ප්‍රේෂණය කර ගන්නා ලෙසත් ඉතිරි ගෙවීම් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත පියවන ලෙසත් සංවර්ධන පාර්ශවයන්ට දැනුම් දීමෙන් රාජ්‍ය අමාත්‍යාංශය කාලෝචිත පියවර ගෙන ඇත. | ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය(NEMO), රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව(SD&CC) සහ ඉංජිනේරු කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශන කාර්යංශය (CESL) යන ආයතන විසින් පෞද්ගලික කොන්ත්‍රාත් කරුවන්ගෙන් ඉවත් කරන ලද ඛණිජ ද්‍රව්‍ය වෙනුවෙන් මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කාර්යංශය (CESL)යන ආයතන වලින් අයකල යුතුව පැවතුණි. එම මුදල් අයකර ගැනිමට නොහැකි වී තිබුණි. | | |
| Vi | ක්ෂේත්‍ර පරික්ෂණයට භාජනය වු ඒරෙ වැව හා ලබුනොරුව වැවෙහි පෝෂක ඇල මාර්ගයෙහි දෙපස වැලි තැන්පත් වී ඇති ස්ථානයන් කැණිම් කොට තිබුණි. වැලි නිධි මතුවීවෙන් පසු තාක්ෂණික නිර්දේශ කිසිවක් නොසලකා වැලි ගොඩ දැමීමට කටයුතුකර තිබුණි. එය පාලනය කිරීමට නොහැකි තත්ත්වයට පත්ව ඇති අතර වාරිමාර්ග නිලධාරින්ගෙ උපදෙස් හා ගිවිසුම් කොන්දේසි නොසලකා කොන්ත්‍රාත් කරුවන් කටයුතු කර තිබුණි. | නියමු ව්‍යාපෘතිය අතරතුර ග්‍රාමීය වැව්වල රොන්මඩ ඉවත් කිරීමේ ක්‍රියාවලිය සඳහා රාජ්‍ය අමාත්‍යාංශය විසින් විශේෂයෙන් තාක්ෂණික මාර්ගෝපදේශ නිකුත් කර ඇත. මෙම වැව්වල රොන්මඩ ඉවත් කිරීමේ කටයුතු අදාළ සංවර්ධන පාර්ශවය විසින් වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ සිදු කර ඇත. | තාක්ෂණික නිර්දේශවලට අනුකූලව වැව් වල රොන්මඩ ඉවත් කිරීමට කටයුතු කළ යුතුය. |
| Vii | ගිවිසුම් කොන්දේසි කඩකරමින් වැව් කැනිම් සිදුකර වැලි නිස්සාරනය පමණක් සිදුකොට අනෙකුත් ද්‍රව්‍ය නැවත වැවෙහි තැන්පත්වන ආකාරයට කොන්ත්‍රාත් කරුවන් විසින් වැඩසටහන ක්‍රියාත්මක කර තිබුණි. ඒ අනුව වැව් පුලුල් වීමේ අරමුණ ඉටුවී නොතිබුණි. ඒ අනුව වැලි ස්තරය පමණක් ඉවත් වීම නිසා වැවෙහි ජලය රදා පැවතීම කෙරෙහි අහිතකර බලපෑම් ඇතිවීම තුලින් වැඩසටහන ක්‍රියාත්මක වීමේ අරමුණ ඉටුවී නොතිබුණි. | කඩිනම් රොන්මඩ ඉවත් කිරීමේ ක්‍රියාවලියේ ධනාත්මක සහ ඍණාත්මක බලපෑම් හඳුනාගැනීම සඳහා ප්‍රධාන වශයෙන් නියමු ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදී. නියමු ව්‍යාපෘතිය සමාලෝචනය කරමින් වාරිමාර්ග දෙපාර්තමේන්තුව, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව සහ සංවර්ධන පාර්ශව සමඟ සාකච්ඡා කිහිපයකින් පසුව මාර්ගෝපදේශ සහ ගිවිසුම් සකස් කරන ලදී. | ගිවිසුමේ කොන්දේසිවලට අනුකූලව වැවේ තැන්පත් වන රොන්මඩ ඉවත් කිරීමට කටයුතු කළ යුතුය |
| viii | රොන්මඩ ඉවත්කිරීමේ උපරිමය අඩි 02 ක් නොඉක්ම විය යුතු වුවත් ලබුනොරුව වැවේ අඩි 04 ක් පමණ ගැඹුරට රොන්මඩ හා පස් කපා ඉවත් කර | රාජ්‍ය අමාත්‍යාංශය විශ්වාස කරනුයේ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය මත රජයේ ව්‍යවසායන් වන අදාළ සංවර්ධන පාර්ශවය ගුණාත්මක කාර්යයක් ඉටු කළ | රොන්මඩ ඉවත්කිරීමෙන් පසු වැව අවශ්‍යතා සඳහා පරිහරණය කිරීමට හැකිවන පරිදි සකස් කළ යුතුය. |

| | |
|---|---|
| තිබුණි. ලබුනොරුව වැවේ ඉවත්කරන ලද රොන්මඩ වලින් වැලි නිස්සාරනය කිරීමෙන් පසු ඉවත්කරනු ලබන රොන්මඩ නැවත වැව් පිටියට එකතු වන ලෙසත් වැලි නිස්සාරනය සඳහා ජලය ලබාගැනීමටත් වැලි නිස්සාරණය කරණ ස්ථානයේ සිට වැව් පිටිය තුලට කාණු කපා තිබීම නිසා වැව් පිටිය අවිධිමත් තත්ත්වයට පත්වීම හේතුවෙන් වගාකටයුතු සඳහා ජලය ලබාගැනීම මෙන්ම අනෙකුත් අවශ්‍යතාවයන් සඳහා වැව පරිහරනය කිරීමට බාධා ඇතිවී තිබුණි. | යුතුව තිබූ බවයි. හඳුනාගත් ඍණාත්මක බලපෑම් අදාළ සංවර්ධන පාර්ශවය විසින් වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ තාක්ෂණික මැදිහත්වීම හරහා ඉදිරියේදී නිවැරදි කරනු ලැබේ. |

## 4. මානව සම්පත් කළමනාකරණය

----------------------------------

| විගණන නිරීක්ෂණය<br>------------------------ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම<br>------------------------------ | නිර්දේශය<br>------------ |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අමාත්‍යාංශයේ අනුමත කාර්යය මණ්ඩලය 70 ක් වූ අතර තත්‍ය කාර්ය මණ්ඩලය 37 ක් විය. ඒ අනුව පුරප්පාඩු සංඛ්‍යාව 33 ක් විය. ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 09 ක, තෘතියික මට්ටමේ තනතුරු 03 ක, ද්විතියික මට්ටමේ තනතුරු 12 ක සහ ප්‍රාථමික මට්ටමේ තනතුරු 09 ක පුරප්පාඩු පැවතියද එම තනතුරු වලට බඳවා ගැනිමට කටයුතු කර නොතිබුණි. | අනුමත කාර්යය මණ්ඩලය බඳවා ගැනීම සම්බන්ධයෙන් රාජ්‍ය සේවා, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය වෙතින් වරින් වර ඉල්ලීම් සිදු, කළද,මේ වනතෙක් බඳවාගැනීම් සිදුකර නොමැත. | අත්‍යවශ්‍යම කාර්යමණ්ඩල පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුය. අනිකුත් තනතුරු යටපත් කළ යුතුය. |